**මැදදුම්බර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රිකය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 11 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම

ගිණුම් පිළයෙල කිරිමේ දී , උපචිත පදනම භාවිතා කළ යුතු වුව ද, පරිසර බලපත්‍ර ආදායම් හා පුස්තකාල දඩ සම්බන්ධයෙන් මුදල් පදනම භාවිතා කර තිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ වූ රු.50,062,828 ක උපචිත කර්මාන්ත ණයහිමියන් සමුච්චිත අරමුදල හර කර තිබුණි.

(ආ) එකතුව රු.3,421,054 ක් වූ හිඟ ආදායම් ණයගැතියෝ හා එකතුව රු.29,036 ක් වූ විවිධ ණයගැතියෝ හිඟ ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ගිණුම්කරණ සටහනක් මගින් හෙළිදරව් කළයුතු සභාව වෙත අයිතිය පවරා නොගත් රු.8,490,000 ක් වටිනා වාහන 03ක වටිනාකම්, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 19 දින පරිත්‍යාග ලෙස සභාව වෙත ලැබී තිබුණු අයිතිය පැවරී නොතිබුණු Foton Drump Truck රථය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 නොසැසඳුණු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, ලෙජර් ගිණුමේ ශේෂය හා ශේෂ සනාථ කිරීම් ලිපිවල සඳහන් ශේෂ සමග සැසඳීමේ දි, රු.338,823 ක නොසැසඳීමක් අනාවරණය විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතු වටිනාකම රු.59,120,689 ක් වූ අතර, එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.8,161,110ක් වී තිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.62,615,154 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකමින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.10,350,848 ක් විය.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම් විෂයයන් 05 ක අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.44,116,216 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.** | |
| | මු.රෙ 104 | අංක 252-6479 දරන ඩබල් කැබ් රථය අවස්ථා 2කදී අනතුරකට ලක්ව රු.74,850ක් වැය කර අළුත්වැඩියා කර තිබුණ ද, ඒ සඳහා මූලික පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. |
| (ආ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ අදාළ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය හා 2013 දෙසැම්බර් 13 දිනැති අංක 1841 දරන ගැසට් නිවේදන. | බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කළයුතු ගණයට ගැනෙන කර්මාන්ත 39 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. මේ හේතුවෙන්, මහජන පීඩාවන් වන අයුරින් අවිධිමත් ලෙස කර්මාන්ත පවත්වා ගෙන යාමට ඉඩ සැළසී තිබූ අතර, සභාවට ලබා ගත හැකිව තිබූ ආදායම් ද අහිමි වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂයසඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,652,343 ක් වූඅතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,211,899 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,559,556 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.2,122,080 ක වරිපනම් බදු හිග ශේෂයක් අය වියයුතුව පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,525,172 ක් විය. වර්ෂයේ අය කිරීම්වල ප්‍රතිශතය හිඟයෙන් සියයට 18 ක් හා බිල් කිරීම්වලින් සියයට 63ක් විය. 2014 දෙසැම්බර් 31 දිනට හිග ශේෂය රු.2,325,510 ක හිග ශේෂයක් නිරීක්ෂණය විය. එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.2,038,162 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණ **නමුත්, ඒ** සම්බන්ධයෙන්1987 අංක15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 බදු කුළී

-------

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.3,449,349 ක බදු කුළී හිග ශේෂයක් පැවති අතර, මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.757,400 ක හිග කඩ කුළී ශේෂයක් පැවති අතර, වර්ෂය තුළ දී බිල් කිරිම රු.1,380,000ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 6ක් හා සියයට 12ක් අය කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ශේෂය රු.1,922,036ක් පැවතුණි.

#### 2.2.3 බලපත්‍ර ගාස්තු

------------------------

ඉකුත් වර්ෂයේදී වෙළඳ බලපත්‍ර ගාස්තු බිල් නොකිරීම හේතුවෙන් වර්ෂය ආරම්භයේ හිඟ ගාස්තු වාර්තා නොවුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.114,850 ක හිග ශේෂයක් නිරීක්ෂණය වූ අතර, 2015 ජූනි 30 දිනට එම ශේෂයෙන් රු.60,850 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

#### 2.2.4 ජල ගාස්තු

------------

**(i)** සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.1,006,182ක හිඟයක් පැවතී අතර, වර්ෂය තුළ බිල් කීරිම රු.1,635,464ක් විය. ඉන් වර්ෂය තුළ අය කිරිමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 50ක් හා සියයට 64ක් වූයෙන්, වර්ෂය අවසානයේ හිඟය රු.1,101,452ක් විය. මෙම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.713,877 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි. එම හිග මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සභාව මගින් ක්‍රියාත්මක ජලයෝජනා ක්‍රම 05ක ලබා දී තිබූ ජල සම්බන්ධතා 214කට අදාළව ජලමනු සවිකර නොතිබුණි.

**2.2.5 අක්කර බදු**

------------

රු.80,540 ක ආරම්භක හිඟ ශේෂයට වර්ෂය තුළ බිල් කිරීම රු.35,204ක් වූ අතර, එම අදායම් අය කර ගැනීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 8ක් හා සියයට 18ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.107,587ක හිඟ ශේෂයක් අනාවරණය වූ අතර, එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.79,392 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි. මේ සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.6 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

---------------------------------------

2009 සිට 2014 කාලය තුළ දී සභාබල ප්‍රදේශයේ ස්ථානගත කර තිබෙන සම්ප්‍රේෂණ කුළුණු 24 ක වාර්ෂික වෙළඳ බලපත්‍රගාස්තු අය කර නොතිබුණු අතර, 2009 සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.321,000ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. සභා බල ප්‍රදේශය තුළ ඉදිකර තිබූ අනවසර සම්ප්‍රේෂණ කුළුණු 09ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ**.**

(අ) සභාව මගින් විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම පැහැර හැර තිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතුව තිබූ හිඟ ශේෂය රු.2,618,611ක් විය.

(ආ) සභාවේ පවත්නා කාර්යය මණ්ඩල තනතුරු 82 අතුරින් 10ක් පුරප්පාඩුව පැවති අතර, තාක්ෂණික නිලධාරී, මුරකරු හා පුස්තකාල සේවක තනතුරු 03 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබුණු ආදේශක සේවකයින් 21 ක් දෙනෙකු සඳහා රු.3,038,539 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

**(ඈ)** සභාව සිය අධිකාරී බලය යටතේ කටයුතු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 මැයි 30 දින වන විට බාහිර පුද්ගලයින් විසින් නඩු 19 ක් සභාවට එරෙහිව පවරා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හඳුනා ගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 19 න් 15 ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි. අනවසර ඉදි කිරීම් 02 ක් සම්බන්ධයෙන් කිසිදු දඩ මුදලක් අය කිරීමකින් තොරව නිත්‍යානුකූල කිරීම සඳහා කටයුතු කරමින් පැවතින.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එනු ලබන රු.1,026,860ක කර්මාන්ත ණයගැති ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය, සේවයෙන් පහ කළ හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයින් 19 දෙනෙකුගෙන් වසර 10 ක පමණ කාලයක සිට අය වියයුතු රු.39,867 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු පුස්තකාල 05 මගින් බැහැරට දී තිබූ රු.22,505ක් වටිනා පොත් 83 ක් නැවත පුස්තකාල වෙත භාර නොදී මාස 3ක සිට මාස 12 දක්වා වූ කාලයක් ඉක්මවා තිබුණ ද, මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.

**3.3 හඳුනාගත් අලාභ.**

---------------------

සභාව සතු පුස්තකාල 10ක රු.40,225ක් වූ පොත් 625ක ඌණතාවයක් පැවතියද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 හී විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි.

**3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.**

---------------------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) දිරන හා නොදිරන ලෙස වෙන් කිරීමකින් තොරව දෛනිකව එකතු කරනු ලබන කසළ තෙල්දෙණිය පොළ භූමිය ආසන්න ඉඩමකට බැහැර කරන අතර, විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙළකට සභාව මෙතෙක් යොමු වී නොතිබුණි.

(ආ) ඉහත ස්ථානයේ කසළ බැහැරලීම කෙරෙහි ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් පැන නැගී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 25193 දරන නඩුව විභාග වෙමින් පැවතුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1 සංයුක්ත සැලැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම.**

----------------------

රු.108,085,610ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම හේතුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.4 අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 28 සිට සියයට සියය ඉක්මවා ද, වියදම් විෂයයන් 08 ක සියයට 14 සිට සියයට 70 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය